**ජාතික ආරක්ෂක අරමුදල - 2023**

**------------------------------------------**

## 1. මූල්‍ය ප්‍රකාශන

### 1.1 තත්ත්වාගණනය කළ මතය

ජාතික ආරක්ෂක අරමුදලේ 2023 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ශුද්ධ වත්කම් වෙනස්වීමේ ප්‍රකාශන සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ ප්‍රමාණාත්මක ගිණුම්කරණ ප්‍රතිපත්තිවලට අදාළ තොරතුරුද ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවලට අදාළ සටහන් වලින් සමන්විත 2023 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන, ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154(1) ව්‍යවස්ථාව සමඟ සංයෝජිතව කියවිය යුතු 2018 අංක 19 දරන ජාතික විගණන පනත සහ 1971 අංක 38 දරන මුදල් පනතේ විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. පාර්ලිමේන්තුව වෙත ඉදිරිපත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2023 දෙසැම්බර් 31 දිනට අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 1.2 තත්වාගණනය කළ මතය සඳහා පදනම

මෙම වාර්තාවේ 1.5 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මා මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් තත්ත්වාගණනය කළ මතයක් පළකරනු ලැබේ.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර.) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිති යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ තත්ත්වාගණනය කළ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

### 1.3 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ සහ ඊට සම්බන්ධ පාලනය කරන පාශර්වයන්ගේ වගකීම්

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශයේ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, අරමුදල අඛණ්ඩව පවත්වාගෙන යාමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරීත්වය අරමුදල ඈවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා අරමුදල අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

අරමුදලේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධව පරීක්ෂා කිරීමේ වගකීම, සම්බන්ධ පාර්ශව විසින් දරනු ලබයි.

2018 අංක 19 දරන ජාතික විගණන පනතේ 16(1) උප වගන්තිය ප්‍රකාරව, අරමුදලේ වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

## 1.4 මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණන වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, එහි ප්‍රමාණාත්මක භාවය මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි වන බලපෑම මත රඳා පවතී.

ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනයේ කොටසක් ලෙස මා විසින් විගණනයේදී වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසුබවින් යුතුව ක්‍රියා කරන ලදී. මා විසින් තවදුරටත්,

- ප්‍රකාශ කරන ලද විගණන මතයට පදනමක් සපයා ගැනීමේදී වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන් ඇතිවීමේ අවදානම් හඳුනාගැනීම හා තක්සේරු කිරීම සඳහා අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලැසුම් කර ක්‍රියාත්මක කරන ලදී. වරදවා දැක්වීම හේතුවෙන් සිදුවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදුවන්නා වූ බලපෑම ප්‍රබල වන්නේ ඒවා දුස්සන්ධානයෙන්, ව්‍යාජ ලේඛන සැකසීමෙන් , චේතනාන්විත මගහැරීමෙන්, වරදවා දැක්වීමෙන් හෝ අභ්‍යන්තර පාලනයන් මග හැරීමෙන් වැනි හේතු නිසා වන බැවිනි.

- අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමේ අදහසින් නොවුවද , අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අභ්‍යන්තර පාලනය පිළිබඳව අවබෝධයක් ලබාගන්නා ලදී.

- භාවිතා කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය ,ගිණුම්කරන ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම් අගයන ලදී.

- සිද්ධීන් හෝ තත්ත්වයන් හේතුවෙන් අරමුදලේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ ප්‍රමාණාත්මක අවිනිශ්චිතතාවයක් තිබේද යන්න සම්බන්ධයෙන් ලබාගත් විගණන සාක්ෂි මත පදනම්ව ගිණුම්කරණය සඳහා ආයතනයේ අඛණ්ඩ පැවැත්ම පිළිබඳ පදනම යොදා ගැනීමේ අදාලත්වය තීරණය කරන ලදී. ප්‍රමාණවත් අවිනිශ්චිතතාවයක් ඇති බවට මා නිගමනය කරන්නේ නම් මූල්‍ය ප්‍රකාශනවල ඒ සම්බන්ධයෙන් වූ හෙළිදරව්කිරීම් වලට මාගේ විගණන වාර්තාවේ අවධානය යොමු කළ යුතු අතර, එම හෙළිදරව්කිරීම් ප්‍රමාණවත් නොවන්නේ නම් මාගේ මතය විකරණය කළ යුතුය. කෙසේ වුවද, අනාගත සිද්ධීන් හෝ තත්ත්වයන් මත අඛණ්ඩ පැවැත්ම අවසන් වීමට හැකිය.

- මූල්‍ය ප්‍රකාශනවල ව්‍යුහය හා අන්තර්ගතය සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණව ඇතුළත් වී ඇති බව සහ හෙළිදරව් කිරීම් ඇතුලත් මූල්‍ය ප්‍රකාශනවල සමස්ථ ඉදිරිපත් කිරීම අගයන ලදී.

හැකිතාක් දුරට හා අවශ්‍ය ඕනෑම විටෙක පහත සඳහන් දෑ පරීක්ෂා කිරීම සඳහා විගණන විෂය පථයද පුළුල් කර ඇත.

- තොරතුරු ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් බලන කළ අරමුදලේ කාර්යයන් අඛණ්ඩව ඇගයීමට හැකිවන පරිදි එහි සංවිධානය, පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි විධිමත්ව හා ප්‍රමාණාත්මකව සැලසුම් කර තිබේද යන බව සහ එකී පද්ධති, පරිපාටි, පොත්පත්, වාර්තා හා වෙනත් ලියකියවිලි ඵලදායී ලෙස පවත්වාගෙන යනු ලැබේ ද යන බව;

- යම් අදාළ ලිඛිත නීතියකට හෝ අරමුදලේ පාලක මණ්ඩලය විසින් නිකුත් කරන ලද වෙනත් පොදු හෝ විශේෂ විධානයකට අනුකූලව, අරමුදල ක්‍රියා කර ඇති බව,

- සිය බලතල, කර්තව්‍ය සහ කාර්යයන්ට අනුකූලව කටයුතු කර ඇති බව,සම්පත් සකසුරුවම් ලෙස, කාර්යක්ෂම ලෙස සහ ඵලදායී ලෙස කාලසීමාවන් තුළ සහ අදාළ නිතීරීතිවලට අනුකූලව ප්‍රසම්පාදනය කර භාවිතා කර ඇති බව,

## 1.5 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම සම්බන්ධයෙන් වූ විගණන නිරීක්ෂණ

### 1.5.1 මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීම පිළිබඳ අභ්‍යන්තර පාලනය

ගනුදෙනු කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරීබලය සහිතව ක්‍රියාත්මක කිරීම, අදාළ වන වාර්තාකරණ ප්‍රමිතිවලට අනුකූලව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට අවශ්‍ය වන පරිදි ගනුදෙනු සටහන් කිරීම සහ වත්කම් සඳහා ගිණුම් කටයුතුභාවය පවත්වාගෙන යාම, කළමනාකාරීත්වයේ පොදු සහ නිශ්චිත අධිකාරී බලය සහිතව පමණක් වත්කම්වලට ප්‍රවේශ වීම, සටහන් කරන ලද වත්කම් සඳහා වූ ගිණුම්කටයුතුභාවය පවත්නා වත්කම් සමඟ සාධාරණ කාල වකවානුවලදී සැසඳීම සහ වෙනස්කම් ඇතොත් ඒවා සම්බන්ධයෙන් නිසි පියවර ගැනීම ආදිය සඳහා සාධාරණ තහවුරුවක් ලබාගැනීමට ප්‍රමාණවත් ‘‘මනාලෙස සැලසුම් කරන ලද’’ අභ්‍යන්තර ගිණුම්කරණ පාලන පද්ධතියක් ආයතනය විසින් පවත්වාගෙන යාම අවශ්‍ය වේ.

### 1.5.2 ගිණුම්කරණ අඩුපාඩු

| | විගණන නිරීක්ෂණය | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|
| (අ) | වර්ෂයේ ස්ථාවර තැන්පතු මත පොළී ආදායම ගිණුම්ගත කිරීමේදී රඳවාගැනීම් බදු අඩුකළ ශුද්ධ අගයට දක්වා තිබීම හේතුවෙන් සමාලෝචිත වර්ෂයේ පොළී ආදායම රු.8,703,412 ක් අඩුවෙන් ගිණුම් ගතකර තිබුණි. එසේම සමාලෝචිත වර්ෂයතුල පොළී ආදායම මත අයකර තිබුණු රු. 8,703,412 ක රඳවාගැනීම් බදු පිළිබඳව ගිණුම් තුලින් අනාවරණය කර නොතිබුණි. | අරමුදලේ ස්ථාවර තැන්පත් වලට අදාලව ශුද්ධ අගය පොළී ආදායම ලෙස ගිණුම්ගත කර ඇත. අය කරන ලද රු. 8,703,412 ක රදවාගැනීමේ බදු වටිනාකම මූල්‍ය ප්‍රකාශනයන්හි ඇමුණුම 01 මගින් නිරූපනය කර ඇත. ඉදිරි ගිණුම් වර්ෂයේදී රදවාගැනීමේ බදු ලාභ/අලාභ ගිණුම තුල දැක්වීමට කටයුතු කරනු ලැබේ. | 2017 ඔක්තෝබර් 25 දිනැති අමාත්‍ය මණ්ඩලය තීරණය ප්‍රකාරව හා 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත අනුව බදුකාර්යයන්ට අනුගතවන පරිදි ගිණුම් තැබිය යුතු වීම. |
| (ආ) | සමාලෝචිත වර්ෂය තුල උපලබ්දි කල ස්ථාවර තැන්පතු 04 කට හා අරමුදල් කළමනාකරණ ගිණුමට අදාලව ලැබී තිබුණු රු. 7,016,714 ක පොළී ආදායම මුදල් ප්‍රවාහ ප්‍රකාශයේ මෙහෙයුම් ක්‍රියාකාරකම් වලින් ලත් ආදායම් ලෙස අනාවරණය කර නොතිබුණු අතර ස්ථාවර තැන්පත් ආපසු ගැනීම් ලෙස දක්වා තිබුණි. | අරමුදල සතුව පවතින අතිරික්ත මුදල් ආයෝජනයෙන් පොළී ආදායම් උපයාගනු ලැබුවද එම ඉපැයීම ජාතික ආරක්ෂක අරමුදලේ අරමුණු අනුව ප්‍රධාන කාර්යක් නොවන බැවින්, පොළී ආදායම් ආයෝජන ක්‍රියාකාරම් ලෙස ඇතුලත්කර ඇත. | රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිත 2 හි 8 ඡේදයේ අනුව ප්‍රධාන ආදායම් උත්පාදන ක්‍රියාකාරකම් මෙහෙයුම් ක්‍රියාකාරකම් ලෙස සැලකිය යුතු වීම. |

### 1.5.3 විගණනය සඳහා ලිඛිත සාක්ෂි නොවීම

| විෂය | මුදල | නොසැපයූ විගණන සාක්ෂි | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| | රු. | | | |
| නිවාස ආධාර ගෙවීම. | 11,666,809 | අරමුදල විසින් ක්‍රියාත්මක කරනු ලබන අර්ධ නිවාස ආධාර ව්‍යාපෘතිය යටතේ තෝරාගත් ප්‍රතිලාභීන් වෙත සිදුකරනු ලබන නිවාස ආධාර වාරික ගෙවීම එම ප්‍රතිලාභීන් අයත්වන ත්‍රිවිධ හමුදාව හා පොලිසිය මඟින් සිදුකර තිබුණි. ඒ අනුව අරමුදල විසින් ප්‍රතිලාභීන් වෙත ගෙවීම් කිරීම සඳහා සමාලෝචිත වර්ෂය තුල ත්‍රිවිධ හමුදාව හා පොලිසිය වෙත මුදාහැර තිබුණු මුදලින් රු.11,666,809 ක් වූ නිවාස ආධාර අදාල ප්‍රතිලාභින් වෙත ලැබුණු බවට සනාථවන සාක්ෂි විගණනයට ඉදිරිපත් නොකෙරුණි. | නිකුත් කරන ලද වාරික මුදල් වලට අදාල සනාථන වාර්තා තවමත් ලැබෙමින් පවතින අතර, එම සනාථන වාර්තා ලද විගස විගණනය වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කරනු ලැබේ. | මුදල් රෙගුලාසි 264(1) ප්‍රකාරව කටයුතු කර සෑම ගෙවීමක් සඳහාම වවුචරයේ සඳහන් දල මුදල ලැබුණු බවට කුවිතාන්සියක් මඟින් තහවුරු කරගත යුතු වීම. |

### 1.6 නීති, රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණ ආදියට අනුකූල නොවීම

| | නීති, රීති, රෙගුලාසි ආදියට යොමුව | අනුකූල නොවීම | කළමනාකාරීත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 මගින් සංශෝධිත මුදල්රෙගුලාසි 877 (1) (ඇ) | ව්‍යවස්ථාපිත අරමුදලක ඉදිරි වර්ෂය සඳහා අයවැය ලේඛණය, එම අරමුදලේ අරමුණු වලට අනුකූලව පිළියෙල කර අදාළ අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ අනුමැතිය සහිතව, පවත්නා වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට පෙර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කල යුතු වුවද අරමුදලේ 2023 වර්ෂය සඳහා වූ අයවැය ලේඛණය දින 34 ක ප්‍රමාදයක් සහිතව අනුමැතිය සඳහා ඉදිරිපත් කර තිබුණි. | අයවැය ලේඛණය එම වර්ෂයේ සැප්තැම්බර් 30 දිනට පෙර මහා භාණ්ඩාගාරයේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට සටහන් තබාගන්නා ලදි. | රාජ්‍ය මුදල් චක්‍රලේඛය ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |
| (ආ) | රාජ්‍ය මුදල් චක්‍රලේඛ 01/2020 මගින් සංශෝධිත මුදල් රෙගුලාසි 877(2)(ඇ) හි සඳහන් මාර්ගෝපදේශ අංක 04 හි 6(ආ) ඡේදය. | මූල්‍ය ප්‍රකාශන භාෂා ත්‍රිත්වයෙන් සකස්කර ඉදිරිපත් කළ යුතු වුවද 2023 වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන සිංහල භාෂාවෙන් පමණක් ඉදිරිපත් කර තිබුණි. | ඉදිරි මුදල් වර්ෂයේ සිට මූල්‍ය ප්‍රකාශන භාෂා ත්‍රිත්වයෙන් ඉදිරිපත් කිරීමට කටයුතු කෙරේ. | සංශෝධිත මුදල් රෙගුලාසි 877(2)(ඇ) හි සඳහන් මාර්ගෝපදේශ අංක 04 පරිදි |

| | | | |
|---|---|---|---|
| | | | කටයුතු කළ යුතු වීම. |
| (ඇ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 91 වගන්තිය. | 2017 ඔක්තෝබර් 25 දිනැති අමප/17/2287/703/085 දරන අමාත්‍ය මණ්ඩල තීරණය මගින් අරමුදල ආදායම් බද්දෙන් නිදහස් කිරීමට ප්‍රතිපාදන නොමැති බවට තීරණයකර තිබුණු බැවින් අරමුදලේ ආදායම් සම්බන්ධයෙන් බදු බැඳියාවක් පැවතියද, ඒ සම්බන්ධයෙන් 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 91 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර නොතිබුණි. | අරමුදල ආදායම් බද්දෙන් නිදහස් කර ගැනීම සඳහා අමාත්‍ය මණ්ඩල පත්‍රිකාවක් ඉදිරිපත් කළද ඒ සඳහා අනුමැතිය ලැබී නැත. | 2017 අංක 24 දරන දේශීය ආදායම් පනතේ 91 වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කළ යුතු වීම. |

**1.6 ආයෝජන කළමනාකරණය**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| අතිරික්ත මුදල් කෙටි කාලීන ආයෝජන සඳහා යොමු කළහැකි වුවත් අරමුදලේ කාරක ප්‍රාග්ධන අවශ්‍යතා සඳහා ප්‍රමාණවත් මුදල් ශේෂ පැවතියදී මාසයට අඩු කාල සීමාවන් සඳහා (දින 07) ආයෝජනය කර තිබූ අවස්ථා නිරීක්ෂණය වූ අතර ඒ සඳහා අවම පොළී ආදායමක් ලැබී තිබුණි. කෙසේ වුවද එම ආයෝජන මාස 01 ට නොඅඩු කාලසීමාවන් තුළ උපයෝජනය කිරීමේ අවශ්‍යතා පැනනැගී නොතිබුණි. | ඉදිකිරීම් ප්‍රමාද වීම හේතුවෙන් දින 07 ස්ථාවර තැන්පත් උපයෝජනය කිරීමේ අවශ්‍යතාවක් පැන නොනැගුනි. උපරිම ඵලදායී ලෙස ආයෝජනයන් සිදුකිරීමට සටහන් තබාගන්නා ලදී. | අතිරික්ත අරමුදල් ඵලදායීව ආයෝජනය සඳහා වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කළ යුතු වීම. |

**2. මූල්‍ය සමාලෝචනය**

**2.1 මූල්‍ය ප්‍රතිඵලය**

සමාලෝචිත වර්ෂයේ මෙහෙයුම් ප්‍රතිඵලය රු. 40,365,301 ක ඌනතාවයක් වූ අතර ඊට අනුරූපව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු. 17,189,698 ක් විය. ඒ අනුව මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 23,175,603 ක පිරිහීමක් නිරීක්ෂණය විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව අර්ධ නිවාස ප්‍රතිලාභ ගෙවීම සියයට 66 කින් වැඩිවීම මෙම පිරිහීමට ප්‍රධාන වශයෙන් හේතු වී තිබුණි.

**3. මෙහෙයුම් සමාලෝචනය**

**3.1 මෙහෙයුම් අකාර්යක්ෂමතා**

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| (අ) මෙත්සෙවණ ව්‍යාපෘතිය යටතේ 2023 වර්ෂයේදී රණවිරු ප්‍රතිලාභීන් 174 ක් වෙනුවෙන් රු. මිලියන 174 ක් ගෙවා අවසන් කිරීමට සැළසුම් කළද, ඉන් නිවාස ප්‍රතිලාභීන් 79 ක් වෙනුවෙන් | ඉදිකිරීම් ප්‍රමාදවීම හේතුවෙන් තෙවන වාරික ගෙවීමේ ප්‍රමාදයක් සිදුවිය. ඉදිකිරීම් අවසන් කළයුතු නිශ්චිත කාල | වර්ෂයේ සැලසුම් කළ අපේක්ෂිත ඉලක්ක කරා ළඟාවීමට ක්‍රියා කළ යුතු වීම. |

| | | |
|---|---|---|
| එකතුව රු.27,228,619 ක් වූ අවසන් වාරිකය ගෙවීමට 2023 දෙසැම්බර් 31 දින වනවිටත් අපොහොසත් වී තිබුණි. | සීමාවක් සහිතව ගිවිසුම් ගත වීමට හා සැලසුම්කල පරිදි වාරික ගෙවීමට ඉදිරියේදී කටයුතු කරනු ලැබේ. . | |
| (ආ) 1985 අංක 09 දරණ ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 09 වන වගන්තිය ප්‍රකාරව රාජකාරී ඉටු කරන අතරතුර තුවාල ලැබූ හෝ මිය ගිය සන්නද්ධ හමුදාවල සාමාජිකයන්ට හා පවුල් වලට ප්‍රතිලාභ ගෙවීම හැරුණුවිට පනතේ අරමුණු ප්‍රකාරව ජාතික ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම හා සහතික කිරීමට අදාළ කාර්යය සඳහා සමාලෝචිත වර්ෂයේ ක්‍රියාකාරී සැලැස්ම තුලද වැඩසටහන් සැලසුම්කර නොතිබුණි. | ඉදිරි වැඩසටහන් සැලසුම් කිරිමේදී ජාතික ආරක්ෂාව ප්‍රවර්ධනය කිරීම හා සහතික කිරීමට අදාලව අරමුදලේ පාලක මණ්ඩලය වෙත දැනුවත්වීම සඳහා ඉදිරිපත් කරනු ලබන බව දන්වා සිටිමි. | අරමුදල් පනතේ දැක්වෙන මූලික අරමුණු ඉටුවන අයුරින සැලසුම් පිළියෙල කළ යුතු වීම. |

## 4. ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය

### 4.1 වාර්ෂික කාර්යසාධන වාර්තාව පාර්ලිමේන්තුවේ සහාගත කිරීම

| විගණන නිරීක්ෂණය | කළමනාකාරිත්වයේ අදහස් දැක්වීම | නිර්දේශය |
|---|---|---|
| 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 13 වගන්තිය ප්‍රකාරව අරමුදලේ මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කළ යුතු වුවත් අරමුදලේ 2018 සිට 2021 දක්වා වූ වර්ෂවලට අදාල මූල්‍ය ප්‍රකාශන සහ විගණකාධිපති වාර්තා පාර්ලිමේන්තුවේ සභාගත කිරීමට කටයුතු කර නොතිබුණි. | 2017 වර්ෂය දක්වා ජාතික ආරක්ෂක අරමුදල මුදල් අමාත්‍යාංශය යටතේ පැවති බැවින් එම වර්ෂයට අදාල වාර්තාව සභාගත කිරීමෙන් අනතුරුව මෙම අමාත්‍යාංශය විසින් වාර්තා පාර්මේන්තුවේ සභාගත කිරීමට කටයුතු කරනු ලැබේ. | 1985 අංක 9 දරන ජාතික ආරක්ෂක අරමුදල් පනතේ 13 වගන්තිය ප්‍රකාරව කටයුතු කල යුතු වීම. |